**සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාව - 2023**
-------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත්කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 <u>වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව</u>

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 <u>මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ</u>

### 1.6.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතියට අදාල ලෙජර් ගිණුම් අනුව මුදල් ශේෂයක් සහ ගෙවිය යුතු ශේෂයක් නොතිබුණද මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ රු. 3,953,604 ක මුදල් ශේෂයක් සහ ගෙවිය යුතු ශේෂයක් දක්වා තිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කරන බව. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) පොදු තැන්පත් ලේඛනය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු මුද්දර බදු මුදල රු. 170,198 ක් වුවත් එය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයට ඇතුලත් කර නොතිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කරන බව. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තොග ලේඛනය අනුව වීජී ලාම්පු ඉතිරි තොගය රු. 310,174 ක් වුවත් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ එය රු. 543,172 ක් ලෙස ඉතිරි තොගය රු. 232,998 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කරන බව. | තොග ශේෂය නිවැරදිව ගණනය කළ යුතුය. |
| (ඈ) සමාලෝචිත වර්ෂය තුල වැඩ අවසන් කරන ලද රු. 3,562,734 ක් වූ කර්මාන්ත 05 ක වටිනාකම මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ඉඩම් හා ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කර නොතිබුණු අතර ඉකුත් වර්ෂවල සහ සමාලෝචිත වර්ෂයේ වැඩ අවසන් කරන ලද කර්මාන්ත 02 ක වැඩ වටිනාකම රු. 54,717,294 ක් වුවත් එය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ගොඩනැගිලි යටතේ රු. 58,413,924 ක් ලෙස රු.3,696,630 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කරන බව. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ඉ) සමාලෝචිත වර්ෂය තුල මිලදී ගන්නා ලද රු. 164,925 ක උපකරණ 05 ක වටිනාකම ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී මෙම අඩුපාඩු නිවැරදි කිරීමට අවශ්‍ය උපදෙස් විෂය නිලධාරි වෙත ලබාදුන් බව. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ඊ) ප්‍රාදේශීය සභාවට අයත් ස්ථාන 03 ක් සඳහා විදුලි සම්බන්ධතා ලබා ගැනීම වෙනුවෙන් දරා තිබුණු රු. 155,307 ක් ඉඩම් හා ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී මෙම අඩුපාඩු නිවැරදි කිරීමට අවශ්‍ය උපදෙස් විෂය නිලධාරි වෙත ලබාදුන් බව. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

| | | |
|---|---|---|
| (උ) සමාලෝචිත වර්ෂය තුල දී මිලදී ගත් ලී බඩු උපකරණ වටිනාකම රු. 2,718,780 ක් වුවත් රු. 2,888,460 ක් ලෙස රු. 169,680 ක් වැඩියෙන් ලී බඩු උපකරණ යටතේ දක්වා තිබුණි. | ඉදිරියේදී මෙම අඩුපාඩු නිවැරදි කිරීමට අවශ්‍යා උපදෙස් විෂය නිලධාරි වෙත ලබාදුන් බව. | නිවැරදිව මූල්‍යා ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ඌ) සමාලෝචිත වර්ෂයේ දී රු. 2,590,000 කට මිලදී ගත් බ්‍රෙලර් මැෂිමේ වටිනාකම යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ යටතේ රු. 2,500,000 ක් ලෙස රු. 90,000 ක් අඩුවෙන් දක්වා තිබුණි | 2024 වර්ෂයේ මූල්‍යා ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කරන බව. | නිවැරදි ශේෂ මූල්‍යා ප්‍රකාශනවල ඇතුලත් කළ යුතුය. |
| (එ) සමාලෝචිත වර්ෂය තුල පරිත්‍යාග ලෙස ලැබී තිබුණු ප්ලාස්ටික් ජලටැංකි 02 ක් සහ Tab පරිගණක යන්ත්‍රයක වටිනාකම තක්සේරු කර ගිණුම්ගතකර නොතිබුණි. | 2024 වර්ෂයේ අදාල වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කරන බව. | සභාව සතු වත්කම්වල වටිනාකම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඒ) සමාලෝචිත වර්ෂයේ සතිපොල ප්‍රමාද දඩ ගාස්තු රු. 234,868 ක් වුවත් එය මූල්‍යා මෙහෙයුම් ප්‍රකාශනයේ රු. 134,868 ක් ලෙස රු. 100,000 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2024 වර්ෂයේ මූල්‍යා ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කරන බව. | නිවැරදි ශේෂ මූල්‍යා ප්‍රකාශනවල ඇතුලත් කළ යුතුය. |
| (ඔ) ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. 26,665,930 ක් ලැබුණු අතර ඉන් ප්‍රාග්ධන වියදම රු. 25,282,600 ක් හා අයභාර වියදම් ලෙස රු. 1,383,330 ක් වැයකර තිබුණි. මෙම ගණුදෙනු මූල්‍යා මෙහෙයුම් ප්‍රකාශනයේ දක්වා නොතිබුණි. | 2024 වර්ෂයේ මූල්‍යා ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කරන බව. | නිවැරදිව මූල්‍යා ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වටිනාකම රු. 141,107,722 ක් වූ වත්කම් විෂයයන් 03ක් සහ වගකීම් විෂයයකට අදාලව වෘත්තීය තක්සේකරුවන්ගේ වාර්තා, හිමිකම් ඔප්පු සහ යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය, හිඟ හිටි සතිපොල බදු ලේඛනය සහ තැන්පත් ලේඛනය ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යෙක්ෂණය කිරීමට නොහැකි විය. | සභාව සතු ඉඩම් මැන විධිමත් තක්සේරුවක් සිදු කිරීමට අවශ්‍යා කටයුතු මේ වන විට සිදු කරමින් පවතින අතර අනෙකුත් අදාල ලේඛන හා උපලේඛන යාවත්කාලීන කිරීමට අවශ්‍යා උපදෙස් විෂය නිලධාරීන් වෙත ලබාදුන් බව. | මූල්‍යා ප්‍රකාශනවල දැක්වෙන ශේෂ සනාථ කෙරෙන ලේඛන හා උපලේඛන යාවත්කාලීනව පවත්වාගෙන යා යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි104(4) | 2023 දෙසැම්බර් 15 දින වන විට අනතුරු සිදු වී මාස 02 සිට මාස 36 දක්වා කාලයක් ගත වී තිබුණද වාහන 03 කට අදාල අනතුරු 04 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | මෙම අනතුරුවලට අදාල ප්‍රාරම්භක වාර්තා පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත යවා ඇති අතර අනුමැතිය ලද වහාම පූර්ණ වාර්තා යැවීමට කටයුතු කරන බව. | යොමුගත මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02(IV) ඡේදය | 2023 ජනවාරි සිට නොවැම්බර් දක්වා අතිකාල හා නිවාඩු දින වැටුප් වෙනුවෙන් රු. 879,985 ක මුදලක් ගෙවා තිබුණද ඇඟිලි සලකුණු යන්ත්‍ර වාර්තා මගින් පැමිණීම් හා පිටවීම් සනාථ කරගෙන නොතිබුණි. | 2023 වර්ෂයේ ඇඟිලි සලකුණු යන්ත්‍රය අක්‍රීය වී තිබීම හේතුවෙන් මෙම තත්ත්වය ඇති වූ අතර අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවීමේදී නිලධාරීන්ගේ අත්සන් ලේඛනය පරීක්ෂා කර අධීක්ෂණ නිලධාරීන්ගේ නිර්දේශ සහිතව ගෙවීම් කළ බව. | අදාල චක්‍රලේඛ අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 4,313,737 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 943,464 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභා ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | | ඇස්තමේන්තුගත ආදායම<br>රු. | බිල් කළ ආදායම<br>රු. | රැස්කළ ආදායම<br>රු. | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය<br>රු. | ඇස්තමේන්තුගත ආදායම<br>රු. | බිල් කළ ආදායම<br>රු. | රැස්කළ ආදායම<br>රු. | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය<br>රු. |
| (i) | වරිපනම් හා බදු | 30,340 | - | - | - | 5,000 | - | - | - |
| (ii) | කුලී | 25,536,256 | 21,701,665 | 21,705,990 | (4,325) | 12,897,775 | 12,335,379 | 11,660,769 | 674,610 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,960,400 | 1,225,800 | 1,221,100 | 4,700 | 1,830,200 | 1,052,600 | 1,037,600 | 15,000 |
| (iv) | වෙනත් ආදායම් | 13,760,187 | 10,321,420 | 6,527,518 | 3,763,902 | 16,916,814 | 10,425,389 | 7,933,204 | 2,492,185 |
| | එකතුව | 41,287,183 | 33,248,885 | 29,454,608 | 3,764,277 | 31,649,789 | 23,813,368 | 20,631,573 | 3,181,795 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **වරිපනම් හා බදු**<br>ඉකුත් වර්ෂයන්ට අදාලව සභාව සතු දේපල බදුදීම වෙනුවෙන් අයවිය යුතුව පවතින රු. 5,495,856 ක කුලී ආදායම අයකරගෙන නොතිබුණි. | කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් සතිපොලවල් පැවැත්වීමට නොහැකිවීම මත මෙම ආදායම පොත්වලින් කපා හැරීමට අවශ්‍ය අනුමැතිය සඳහා ගරු ආණ්ඩුකාර තුමා වෙත යොමුකර ඇති බව. | හිඟ ආදායම් අයකර ගත යුතුය. |

| | | |
|---|---|---|
| **කුලී** | | |
| සමාලෝචිත වර්ෂයේ බිල් කරන ලද රු. 1,355,400 ක් වූ කඩ කාමර කුලී ආදායමෙන් රු. 28,400 ක් සහ ඉකුත් වර්ෂවල බිල් කරන ලද කඩ කාමර කුලී ආදායමින් රු. 107,650 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි. | මෙම හිඟ මුදල් අයකර ගැනීම සඳහා බදුකරුවන් දැනුවත් කරන ලද බව. | හිඟ ආදායම් අයකර ගත යුතුය. |
| **වෙළඳ බලපත්‍ර ගාස්තු** | | |
| ප්‍රාදේශීය සභාව සතු කඩකාමර 57 ක් 2023 දෙසැම්බර් 15 දින වන විට බදු පදනම මත ලබා දී තිබුණු අතර එම කඩ කාමර සඳහා කිසිදු දිනක ව්‍යාපාර බදු, කර්මාන්ත බදු හෝ වෙළඳ බලපත්‍ර ගාස්තු අයකර නොතිබුණි. | අදාල අයකර ගැනීම් සිදුකිරීම සඳහා ආදායම් පරීක්ෂක වෙත උපදෙස් ලබා දුන් බව. | සභාවට ලැබිය යුතු බදු සහ ගාස්තු අයකරගත යුතුය. |
| **වෙනත් ආදායම්** | | |
| (අ) 2023 වර්ෂයේ හඳුනාගෙන තිබුණු දැන්වීම් පුවරු 126 ක් වෙනුවෙන් අයවිය යුතු රු. 599,565 ක දැන්වීම් පුවරු ගාස්තු අයකරගෙන නොතිබුණි. | අදාල හිඟ මුදල් අයකර ගැනීමට ආදායම් පරීක්ෂක වෙත උපදෙස් ලබාදුන් බව. | හිඟ ආදායම් අයකරගත යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂයට අදාලව ජල පාරිභෝගිකයින් 131 ක ගෙන් අයවිය යුතු රු. 173,119 ක හිඟ ජල ගාස්තු 2023 දෙසැම්බර් 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි. | හිඟ ජල ගාස්තු කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් අයකරගත යුතුය. |
| (ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු. 272,500 ක් සහ මුද්දර ගාස්තු රු. 4,770,082 ක් ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම හිඟ ආදායම් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | හිඟ ආදායම් අයකරගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටුකිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

## (අ) පරිසර ආරක්ෂණ බලපත්‍ර

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) සභාව විසින් පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු කර්මාන්ත හඳුනා ගැනීම සඳහා 2023 වර්ෂයේ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | 2022 වර්ෂයේ සිදුකරන ලද සමීක්ෂණය අනුව 2023 වර්ෂයේ පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තු අයකරගෙන ඇති බව. | සභාව විසින් බලප්‍රදේශයේ පවත්නා කර්මාන්ත නියාමනය කළ යුතුය. |
| (ii) පරිසර ආරක්ෂණ බලපත්‍රවල වලංගු කාල සීමාව අවසන් වූ කර්මාන්ත 08 ක් සඳහා නැවත පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | මෙම කර්මාන්ත සඳහා පරිසර බලපත්‍ර ලබා ගැනීමට අදාල පාර්ශව දැනුවත් කර ඇති බව. | සභාව විසින් බලප්‍රදේශයේ පවත්නා කර්මාන්ත නියාමනය කළ යුතුය. |

## (ආ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) 2022 නොවැම්බර් 18 දිනැති අංක 2307 දරන ගැසට් පත්‍රය මගින් සභාව විසින් කසල ශෝධනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යටතේ ගාස්තු අයකල යුතු බව දක්වා තිබුණද 2023 වර්ෂයට අදාලව කසල සඳහා ගාස්තු අයකළ යුතු ආයතන හඳුනාගෙන ගාස්තු අයකර ගෙන නොතිබුණි. | 2024 වර්ෂයට අදාලව මෙම කටයුතු විධිමත් කිරීමට කටයුතු කරන බව. | අදාල අතුරු ව්‍යවස්ථාව අනුව කසල සඳහා ගාස්තු අයකළ යුතුය. |
| (ii) 2022 නොවැම්බර් 18 දිනැති අංක 2307 දරන ගැසට් පත්‍රයේ ත්‍රී රෝද රථ ගාල් තුල ඇති ත්‍රී රෝද රථ ලියාපදිංචි කිරීම සඳහා රු. 5,000 ක මුදලක්ද මාසික ගාස්තුව ලෙස රු. 150 ක මුදලක් ද අයකරන බව දක්වා තිබුණද ත්‍රී රෝද රථ ගාල් සඳහා අතුරු ව්‍යවස්ථාවක් සභාව විසින් සකස් කර හෝ වැළඳගෙන නොතිබුණි. | මේ සම්බන්ධයෙන් ඉදිරියේදී විධිමත් පියවර ගැනීමට කටයුතු කරන බව. | අතුරු ව්‍යවස්ථාවක් සකස් කිරීමට කටයුතු කළ යුතුය. |

**(ඇ) ජල ව්‍යාපෘති**

| | | |
|---|---|---|
| සභාව විසින් පවත්වා ගෙන යනු ලබන දෙමටබැද්ද ජල ව්‍යාපෘතිය මගින් ලබා ගන්නා ජලය පානය කිරීමට සුදුසු තත්ත්වයේ පවතීද යන්න තහවුරු කර ගැනීමට ජල සාම්පල් පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. | කඩිනමින් ජල සාම්පල් තත්ත්ව පරීක්ෂණ සඳහා යොමුකර වාර්තා ලබා ගැනීමට කටයුතු කරන බව. | බලප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය පිළිබඳව අවධානය යොමුකළ යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ---------------------------------- | ---------------- |
| (අ) නිලධාරීන්ගේ අකාර්යක්ෂමතාවය, නොසැලකිල්ල හා නියමිත ක්‍රියාපිළිවෙත් අනුගමනය නොකිරීම හේතුවෙන් ප්‍රාදේශීය සභාවට අයත් වාහන අනතුරු 02 කට අදාලව ලැබිය යුතු රු. 474,578 ක රක්ෂණ වන්දි මුදල් 2023 දෙසැම්බර් 15 වන විටත් ලබාගෙන නොතිබුණි. | මෙම ගැටළුව නිරවුල් කිරීමට අවශ්‍ය පියවර ගනිමින් සිටින බව. | අදාල අලාභය රක්ෂණ ආයතන වෙතින් සහ වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගත යුතුය. |
| (ආ) ප්‍රාදේශීය සභාවට අයත් බැකෝ/ලෝඩර් යන්ත්‍රය 2020 සැප්තැම්බර් 08 අනතුරකට ලක් වී තිබුණු අතර 2023 දෙසැම්බර් 15 දින වන විටත් අලුත්වැඩියාව සිදුකරගෙන නොතිබුණු අතර රක්ෂණ වන්දි මුදල්ද ලබාගෙන නොතිබුණි. | රටතුල පැවති කොරෝනා වසංගත තත්ත්වය මත මෙම අලුත්වැඩියා කටයුතු ප්‍රමාද වූ අතර මේ වන විට අදාල ආයතන වෙතින් මිල කැදවුම් ඇස්තමේන්තු ලබා ගෙන පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂ වෙත යොමු කර ඇත. | යන්ත්‍රයේ අලුත්වැඩියාවන් කඩිනමින් සිදු කල යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ------------------------------- | ---------------- |
| (අ) සියඹලාණ්ඩුව පොළ භූමියේ දෙමහල් වෙළඳ සංකීර්ණයේ පිහිටි කඩ කාමර 10 ක් 2017 වර්ෂයේ සිට බදු දී නොතිබුණි. | මෙම කඩ කාමර ප්‍රසම්පාදනය කළද එම කඩ කාමර ලබා ගැනීමට කිසිවෙකු ඉදිරිපත් වී නොමැති බව. | සභාව සතු කඩ කාමර බදු දී බදු ආදායම් රැස්කරගත යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) ප්‍රාදේශීය සභාවට අයත් සියඹලාණ්ඩුව සතිපොළ පරිශ්‍රයේ අංක 03 කඩ කාමරය රු. 117,450 ක මූලික මුදලකට 2021 ඔක්තෝබර් 06 දින සිට වසර 03 ක් දක්වා බදු දී තිබුණු අතර මූලික මුදල් මාසික වාරික 11 කින් අයකර ගැනීමට තීරණය කර තිබුණි. 2023 මාර්තු 27 දින බදුකරු විසින් කඩ කාමරය සභාවට භාරදී තිබුණු අතර අදාල මූලික මුදලින් රු. 96,102 ක් අයකරගත යුතුව පැවතුණි. | හිඟ මුදල් අයකර ගැනීම සඳහා අදාල පාර්ශවයන් වෙත ලිඛිත දැනුවත් කිරීම් සිදුකර ඇති බව. | හිඟ ආදායම් අයකරගත යුතුය. |
| (ඇ) සභාවේ සේවය කළ නිලධාරීන් 03 දෙනෙකුට ලබාදී තිබුණු රු. 168,378 ක සේවක ණය වර්ෂ 1 කට වඩා වැඩි කාලයක සිට අයනොවී පැවතුණි. | හිඟ ණය ශේෂ කඩිනමින් අයකර ගන්නා බව. | සේවක ණය ශේෂ කඩිනමින් අයකරගත යුතුය. |

## 3.4 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සභාව විසින් භාවිතා කරනු ලබන වාහන 02 ක නීත්‍යානුකූල අයිතිය සභාව වෙත පවරාගෙන නොතිබුණි. | මෙම ගැටළුව විසඳීමට කඩිනමින් පියවර ගන්නා බව. | වාහනවල නීත්‍යානුකූල අයිතිය පවරාගත යුතුය. |
| (ආ) සභාව සතු වාහන 2 ක එන්ජින් අංකද එක් වාහනයක චැසි අංකයද වාහන ලියාපදිංචි කිරීමේ සහතිකයේ සඳහන් එන්ජින් හා චැසි අංක සමඟ නොගැලපෙන බව නිරීක්ෂණය විය. | මෙම ගැටළුව විසඳීමට අවශ්‍ය පියවර මේ වන විට ගනිමින් සිටින බව. | සභාව සතු වත්කම්වල අයිතිය සහ ආරක්ෂාව සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතුය. |
| (ඇ) සභාව සතු ට්‍රැක්ටර් රථ 02 හි මයිලෝ මීටර් අක්‍රීය වී තිබුණු අතර ඒවා අලුත්වැඩියා කිරීමකින් තොරව රාජකාරි කටයුතු සඳහා යොදවා තිබුණි. | අත්‍යවශ්‍ය සේවාවන් පවත්වාගෙන යාම සඳහා කාර්මික නිලධාරීන්ගේ පූර්ණ අධීක්ෂණය යටතේ මෙම රථ 2 සේවයේ යොදවා ඇති අතර මෙම ගැටළුව කඩිනමින් විසඳීමට පියවර ගන්නා බව. | සභාව සතු වාහන හා යන්ත්‍ර අදාල අවස්ථාවලදී අලුත්වැඩියා කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) සභාව සතු ජල බවුසර් රථයේ මයිලෝමීටරය අනුව ධාවනය කර ඇති කිලෝමීටර් ගණන 2968 ක් වුවත් දෛනික ධාවන සටහන් පොත අනුව එය 2849 ක් ලෙස සටහන් කර තිබීමෙන් දෛනික ධාවන සටහන් පොත අනුව මයිලෝ මීටරයට වඩා කිලෝමීටර් 119 ක් වැඩියෙන් ධාවනය කර තිබුණි. | මේ සම්බන්ධයෙන් රියදුරු වෙත අවවාදාත්මක ලිපි නිකුත් කර නිදහසට කරුණු විමසා ඇති අතර වාහනවල මයිලෝමීටර් හා ධාවන සටහන් පොත් මාසිකව පරීක්ෂා කිරීමට විෂය නිලධාරි වෙත උපදෙස් ලබාදුන් බව. | සභාව සතු වාහන සේවයේ යෙදවීමේ කටයුතු විධිමත්ව සිදුකළ යුතුය. |
| (ඉ) ඉකුත් වර්ෂවල දී පුස්තකාල 04 ක පිරිවැය රු. 128,184 ක පුස්තකාල පොත් 562 ක් පාඨකයින්ට ලබාදී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් නැවත භාරදී නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කඩිනමින් පියවර ගන්නා බව. | පාඨකයින් වෙත ලබාදුන් පොත් නැවත ලබාගත යුතුය. |

**3.5 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | --------------------------------- | ---------------- |
| සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාව සතු ටෙන්ඩර් දේපල බදු දීමට 2022 ඔක්තෝබර් 10 දින මිල ගණන් කැඳවා රු. 85,825 ක මුදලක් වැයකර ලංසු ඉදිරිපත් කළ හැකි පාර්ශව සීමා කර පුවත්පත් දැන්වීම් පල කර තිබුණි. | ඉදිරියේදී මෙම අඩුපාඩුව නිවැරදි කිරීමට පියවර ගන්නා බව. | ප්‍රසම්පාදන කටයුතු විධිමත්ව සිදු කළ යුතුය. |

**3.6 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | --------------------------------- | ---------------- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ තනතුරු 06 කට අදාලව අනුමත කාර්ය මණ්ඩලය අනුව නිලධාරීන් 07 කගේ පුරප්පාඩු පැවති අතර එම පුරප්පාඩු පිරවීමට කටයුතුකර නොතිබුණි. | කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්බන්ධයෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත ලිඛිතව දැනුවත් කර ඇති බව. | කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණකර ගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙලකර තිබුණු අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තු කළ ආදායම් හා වියදම්, වර්ෂයේ තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 08 ක සියයට 06 සිට සියයට 100 දක්වාද වියදම් විෂයයන් 07 ක සියයට 19 සිට සියයට 87 දක්වාද විචලනයන් පැවතුණි. මේ අනුව අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි. | ඉදිරියේදී නිසි පරිදි අයවැය සකස් කිරීමට පියවර ගන්නා බව. | වාර්ෂික අයවැය ඇස්තමේන්තු වඩාත් තාත්විකව පිළියෙල කළ යුතු අතර එම ඉලක්කයන් සපුරා ගැනීමට කටයුතු කළ යුතුය. |